## නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මර්තු 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජූනි 12 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

සභාපතිවරයා වෙත යවන ලද වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති නුවරඑළිය ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.46,098,864 ක් වු ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.4,857,273 ක් වු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මව ආදායම රු.14,629,985 ක් විය.

2.2 මූල්‍ය පාලනය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 24 රීතිය ප්‍රකාරව එකතු කර ඇති සම්පූර්ණ මුදල දිනපතා බැංකුවෙහි තැන්පත් කළ යුතු වුවද, කඳපොල උපකාර්යාලයේ රැස්කරන ලද රු. 49,934 ක් හා නානුඔය උපකාර්යාලයේ රැස්කරන ලද රු. 78,580 ක් බැංකු ගත කිරීමෙන් තොරව මාස 04 ක පමණ කාලයක් අත රඳවාගෙන තිබුණි.

2.3 ආදායම් පරිපාලනය.

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය. | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය. |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (I). | වරිපනම් හා බදු | 4,025 | 4,075 | 4,491 |
| (II). | බදු කුලී | 5,318 | 4,733 | 657 |
| (III). | බලපත්‍ර ගාස්තු | 4,715 | 2,821 | - |
| (IV). | වෙනත් ආදායම් | 25,832 | 18,907 | 2,356 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,343,165 |
| (ii) | මුද්දර ගාස්තු | 2,057,333 |

2.3.3 වාහන ගාල් කිරීමේ ගාස්තු.

හග්ගල උද්භිද උද්‍යානය අසල වාහන ගාල් කිරීමේ ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි. 2012 වර්ෂයට අදාළ බදු අයිතය එක් පුද්ගලයකුගේ ඉල්ලීම මත රු. 316,968 ක මුදලකට ටෙන්ඩර් කැඳවීමකින් තොරව පවරාදී තිබුණි. 2012 පෙබරවාරි 22 දින වන විටත්, බදුකරු සමඟ විධිමත් ගිවිසුමකටද එළඹ නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු.
------------------------------------------------------------
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(i) උප වගන්තියේ, හා මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ 48 (1) රීතියේ විධිවිධාන වලට පටහැනිව ප්‍රධාන ලේකම් වරයාගේ හා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව සේවකයින් 10 දෙනෙකු බඳවාගෙන 2008 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව රු.9,743,144 ක් වැටුප් ගෙවා තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා.
-----------------------------
නානුඔය උපකාර්යාලයට අනුයුක්ත කර ඇති ආදායම් පරීක්ෂකවරයා 2010 ජනවාරි මාසයේ සිට 2011 ජූනි 30 දක්වා වූ අවු. 01 මාස 06 ක කාලයක් තුල දින 42 ක නිවාඩු ලබාගැනීමකින් තොරව රාජකාරි සඳහා වාර්තාකර නොතිබුණද, ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය.
-------------------------
ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි